# සුදු මහත්තයාට හමු නොවූ පුල්එළියේ සුන්දර මංගල්‍යය

ශ්‍රී ලංකාවේ පිටිසර ගම්මානයක ඉඩම් භුක්තිය සහ ඥාතීත්වය පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කෙරුණේ 1954 දී ය. ඒ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සමාජ-මානව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඊ.ආර්. ලීච් මහතා විසිනි. ඒ සඳහා එතුමා තෝරා ගනු ලැබුවේ පුල්එළිය නම් වූ ගම්මානයයි. පුල්එළිය, උතුරුමැද පළාතේ නුවර කලාවිය (අනුරාධපුර) දිස්ත්‍රික්කයේ කැන්දකෝරලේ පිහිටි සුන්දර ගම්මානයකි. එය පිහිටා තිබෙන්නේ අනුරාධපුරයට සැතපුම් 12ක් උතුරිනි (ලීච් - 2003). ලීච් මහතාගේ අධ්‍යයනයෙන් වසර 53ට පසුව, එම ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවක යෙදීමේ අවස්ථාව හිමි වූයේ අහඹු ලෙසින් වුවත්, එය මෙම මානව විද්‍යාත්මක අධ්‍යයනය කෙරෙහි මා තව තවත් ලොල් බැඳීමට සමත්වීම ඉතාමත්ම ආශ්වාදජනක සිදුවීමකි. ඉන් ලද අත්දකීම් සමාජ විද්‍යාත්මක දෘෂ්ටියකින් විග්‍රහ කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

කොළඹ සිට පැය 6 1/2 ක ගමනකින් අනතුරුව පුල්එළිය ගම්මානයට ළඟාවීමට අපට හැකියාව ලැබුණි. මෙම ක්ෂේත්‍ර චාරිකාවේ මූලික අරමුණ වූයේ පුල්එළිය ගමේ වාර්ෂිකව පැවැත්වෙන මුට්ටි-නැමීමේ මංගල්‍යය පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙම උත්සවය පැවැත්වෙන්නේ සෑම වර්ෂයකම ජූනි-අගෝස්තු මාස දෙක තුළ දී යොදා ගන්නා දිනයකදී ය. මෙහි දී මූලික වශයෙන්ම සිදු වන්නේ දෙවියන් පිදීමයි.

### මුට්ටි නැමීමේ මංගල්‍යය

කලට වේලාවට වී ගොවිතැනේ නිරත වූ අතීත හත් කෝරළයේ වැව් ගම්මානවල ගොවීන් තමන් නෙළාගත් අස්වැන්නෙන් පළමු කොටස වෙන් කළේ දෙවියන් සඳහා ය. එය අක්යාල යනුවෙන් හැඳින් වේ. මෙම අක්යාල දෙවියන්ට පිදීමේ අවස්ථාව මුට්ටි නැමීමේ මංගල්‍යය ලෙස හැඳින් වේ. මෙහි දී සිදු වන්නේ ගොවිතැන් සාරවත් කර ගැනීමට අදෘශ්‍යමාන ලෙසින් පිහිට ආධාර කළා යැයි අනුමාන කරන දෙවි දේවතාවුන්ට කෘතගුණ සැලකීමයි. එමනිසා, වැව් ගම්මානයකින් වැව් ගම්මානයකට මුට්ටි නැමීමේ මංගල්‍යයේ ඇවතුම්-පැවතුම් වෙනස් විය හැකි වුවත් ඒ සියළු පිළිවෙත් පෙළ ගැසී තිබෙන්නේ කෘතගුණ දැක්වීම සඳහාම ය. (මහින්ද කුමාර දළුපොත: මුට්ටි නැමීමේ මංගල්‍යයේ වගතුග)

පුරාණ හත් කෝරළයේ වැව් ගම්මානවල ගොවීන් මුට්ටි නැමීමේ මංගල්‍යයට සූදනම් වූ ආකාර කිහිපයක් දකගත හැකි වේ. ඒ අතර මූලික පිළිවෙත් දෙකක් හඳුනාගත හැකිය. එනම්, මුට්ටි නැමීමේ මංගල්‍යය පවත්වන දිනට පෙර දින විදනේ උන්දැගේ ගෙදරට රැස් වී අවශ්‍ය කටයුතු කළමනා සූදනම් කිරීමයි. අනෙක මුට්ටි මංගල්‍යයට උවමනා කළමනා සියල්ල සවස් යාමේ වැවේ මුට්ටි ගහ අද්දරට ගෙන ගොස් පසුව ද පහන් වනතුරු මුට්ටි මංගල්‍ය ට සූදනම් වීමයි. මේ පිළිවෙත් දෙකටම අමතරව තවත් වෙනස්කම් සහිතව මුට්ටි නැමීමේ මංගල්‍යයට සූදනම් වන ගම්මාන ද දක ගත හැකිය. (මහින්ද කුමාර දළුපොත, මුට්ටි මංගල්‍යයේ වගතුග) මෙහි දී පුල්එළිය ගමේ මුට්ටි නැමීමේ මංගල්‍ය මේ ආකාර දෙකටම පරිබාහිර වූවකි. එමෙන්ම, පුරාණ මුට්ටි නැමීමේ මංගල්‍යයේ කිරි ඉතිරවීමේ චාරිත්‍රයක් තිබුණ ද පුල්එළිය ගමේ දී එවැන්නක් දක ගත නො හැකි වූ අතර කිරිබත් පිසීම එද සේම අදටත් දක ගත හැකිය.

පුරාණ ජන සම්මතයන්ට අනුව මුට්ටි නැමීම සිදු වූයේ යල-මහ දෙකන්නයේ කුඹුරු ගොවිතැන් කටයුතු ආරම්භ වීමට ප්‍රථමයෙනි. එනම්, යායේ මුල් හීය පිරීමට ප්‍රථමයෙන් කෙම්මුර දවසක ගම්මානයේ සියළු දෙනාම එක්ව මෙම කටයුත්ත සිදු කළ ද, වර්තමානය වන විට එය බොහෝ සේ පරිණාමය වී ඇති ආකාරය පෙනේ. දනට එය හුදු චාරිත්‍රයක් බවට පමණක් පත් වෙමින් තිබේ. තවත් ඉදිරියට වසර ගණනාවක් මෙම චාරිත්‍රය පවතී යැයි විශ්වාස කළ හැකි සාධක පුල්එළිය මුට්ටි නැමීමේ මංගල්‍යයේ දී දක ගත හැකිය. ඒ තරුණ පරම්පරාව මෙන්ම බාල පරම්පරාව ද එකසේ මෙම මංගල්‍ය සඳහා උනන්දුවෙන් සහභාගීවීමට පෙළඹී ඇති නිසාවෙනි. එහි දී, සමාජානුයෝජන ක්‍රියාවලිය වඩා හොඳින්ම සිදු වේ. ඒ තුළින් මෙම චාරිත්‍රය ඉදිරියටත් පැවතීමේ සුබ ලකුණු නිතැතින්ම දිස් වෙයි.

පවුල් 150ක් පමණ වෙසෙන පුල්එළිය ගම්මානයේ සෑම නිවසකින්ම මෙම මංගල්‍ය සඳහා අවශ්‍ය කළමනා මෙන්ම මුදල් ද එක් රැස් කරනු ලැබේ. ඒ අතර කැවුම් සහ සහල් ප්‍රධාන වේ. සියළු කටයුතු සිදු කරන්නේ පන්සල කේන්ද්‍ර කොට ගැනීමෙනි. ගමේ ප්‍රධාන කපුරාළ මෙම මංගල්‍යයේ දී ප්‍රධාන චරිතය නිරූපනය කරනු ලබයි. ඔහු මේ සඳහා මස් මාංශ අනුභවයෙන් තොරව වත් පිළිවෙත් රකිමින් මංගල්‍ය සිදු කෙරෙන දිනය දක්වා ජේවී සිටිය යුතු ය. ගමේ සියලුම සාමාජිකයන් එක්වන මරණාධාර සමිතියේ දී මංගල්‍ය සඳහා දින නියම කර ගනු ලබන අතර ඉන් අනතුරුව ඒ සඳහා බුලත් දී කපුරාළට ආරාධනා කරනු ලබයි. එදින සිට ඔහු මස් මාංශ අනුභවයෙන් වැළකී මංගල්‍යය සඳහා සූදානම් වෙයි. මුට්ටි නැමීමේ මංගල්‍යය සිදු කෙරෙන්නේ කෙම්මුර දිනයකදී ය.

ඉතාමත් එකමුතු භාවයෙන් කටයුතු කරන පුල්එළිය ගම්වාසීන්ගේ මෙම මංගල්‍යයත් එකමුතුභාවයේ සංකේතයක් වැනි ය. ඒ සඳහා තවත් කදිම නිදසුනක් අපට දකගත හැකි විය. එනම්, ගමේ මරණාධාර සමිති 2ක් පවතින අතර එම මංගල්‍යයේ කටයුතු වසරින් වසර මාරුවෙන් මාරුවට එම සමිති දෙකේ සාමාජිකයින්ගේ මූලිකත්වයෙන් සිදු කරනු ලැබීමයි. මුට්ටි නැමීමේ මංගල්‍යයට පෙර දින සවස් යාමයේ සිටම ගම්වාසීන් කැවුම්, සහල්, බුලත්, පුවක්, මුදල් ආදිය පන්සලට ගෙනැවිත් භාර දෙනු ලබයි. විධිමත් ආකාරයට ඒවා සටහන් කර ගනු ලබන්නේ අදාළ සමිතියේ සාමාජිකයෙකු විසිනි. එකතු වූ සියලු බඩු රැස්කොට එය පසුද වනතෙක් ආරක්‍ෂා කිරීමේ වගකීම පුරුෂ පාර්ශවය වෙත පැවරෙන කාර්යයකි. තම වගකීම දේව කාර්යයක් ලෙස ඉටු කිරීමට සැදී පැහැදී සිටින ගම්වාසී පුරුෂ පාර්ශවය පසුද පහන් වන තුරු නිදිවර්ජිතව ගත කරනු ලබයි. එහි දී, අතීතයේ තමන් විඳි අත්දකීම් බෙද හද ගැනීමත්, උසුළු විසුළු කර ගැනීම් මෙන්ම කාලය ගත කිරීමට කාඩ් සෙල්ලම් කිරීම වැනි ද සිදු වේ.

මුට්ටි නැමීමේ මංගල්‍යයේ දී සිදු වන්නේ දෙවිවරුන් දෙදෙනෙකු වෙත පුද පූජා පැවැත්වීමයි. ඒ සඳහා නැවුම් මුට්ටි දෙකක් යොද ගනී. මෙම මුට්ටි නැමීම සිදු කෙරෙන්නේ වැව් ඉස්මත්තේ වන වැව් බැම්ම මත සිටුවන ලද දෙබලක් සහිත මුක්කුවක් මත ය. ඒ අසලම සකසන ලද පුදසුනක් මත බුලත් අතුරා ඒ මත දෙවියන්ට පුද පූජා පවත්වනු ලබයි. ඒ අයියනාර් හා පුල්ලෙයාර් යන දෙවිවරුන් දෙදෙනා උදෙසා යි. මේ සියළු කටයුතු සිදු කෙරෙන්නේ හිමිදිරි උදසන 5.00ට පමණය. පන්සලේ සිට වැව් බැම්ම දක්වා දෙවියන් උදෙසා වූ පුද පූජා භාණ්ඩ රැගෙන එනු ලබන්නේ බෙර වයමින් උඩු වියන් යටිනි. පුද පූජා පවත්වන අතරතුර ගමේ ප්‍රධාන කපුරාළ මායම් වන අතර ඒ අවස්ථාවේ දී නැවුම් මුට්ටි දෙක වැව් බැම්ම මත සිටුවන ලද දෙබලක් සහිත ඉන්නක රඳවනු ලබයි. එම කටයුක්ත අවසන් බව සියළු ගම්වාසීන්ට දන්වනු පිණිස වෙඩි උණ්ඩ දෙකක් පත්තු කෙරේ. එම කටයුක්ත එතැනින් අවසන් වන අතර දිවා කාලය වන විට සියලුම ගම්වැසියන් පන්සල් භූමියට එක්වී හමාර ය. එහි දී, ගැහැණු පාර්ශවය එක්ව සියළුම ගම්වාසීන්ට දිවා ආහාරය පිළියෙළ කරනු ලැබේ. ඒ අතරතුර විෂ්ණු දේවාලයේ විෂ්ණු දෙවියන් උදෙසා පුද පූජාවක් පැවැත් වේ. එහි දී, විෂ්ණු දෙවියන් උදෙසා රජහැලිය නම් භාජනයේ විශේෂ බතක් පිළියෙළ කෙරේ. ඊට සහල්, හකුරු, වට්ටක්කා, අළුකෙසෙල්, පොල්කිරි යනා දී ද්‍රව්‍ය එක් කරනු ලබන අතර මේ සියළු කාර්යයන් සඳහා පුරුෂ පාර්ශවය පමණක් සහභාගීවීම විශේෂත්වයකි.

එම බත සකස් කර අවසන් වූ පසුව විෂ්ණු දේවාලයේ විශේෂයෙන් සරසන ලද අසුනක් මත තබා දෙවියන්ට පූජා කරනු ලැබේ. මෙහි දී මායම් වන කපුරාළගෙන් ගම පිළිබඳ තොරතුරු අසා දනගත හැකි වේ. මෙය ඉතාම සුවිශේෂී වූ අවස්ථාවක් වන අතර මේ අවස්ථාව එළඹෙන තුරු සියළු ගම්වාසීන් බලා සිටියත් දේවාලයට ඇතුල්වීමට ස්ත්‍රී පාර්ශවයට අවසර නො ලැබේ. මෙලෙස මායම් වූ කපුරාළ දේවාලයේ සිට මායමින්ම පන්සල් වත්තෙන් එපිට පිහිටා ඇති නුග ගසක් වෙත ගමන් කරනු ලබන්නේ ගොටු පිදීම නම් වූ කාර්යය සඳහා ය. ඒ ප්‍රේතයින් වෙනුවෙනි. මේ යන ගමන අතරතුර තවත් සුවිශේෂී සිදුවීමක් සිදු වේ. ඒ ගම්වාසීන්ගේ විශ්වාසයකි. මෙලෙස මායමින් ගමන් කරන කපුරාළ යන ගහ දිගේ කුඩා දරුවන් හාන්සි කරනු ලබන අතර ඔවුන්ගේ ශරීර අතරින් කපුරාළ ගමන් කරයි. ගම්වාසීන්ගේ විශ්වාසය වන්නේ එසේ කිරීමෙන් තම දරුවන්ට වැළඳී ඇති ග්‍රහ දෝෂ නිවාරණය වන බවකි. අවසානයේ රජ හැලියේ බත ද ගම්වාසීන්ට බෙද දී දෙවියන්ගේ

ආශිර්වාදය ලබා ගැනේ. මේ ආකාරයෙන්ම පුල්ලෙයාර් දෙවියන්ට ද පුද පූජා පැවැත් වේ. මෙහි දී, දෙවි දේවතාවුන් මෙන්ම ප්‍රේත, කුම්භාණ්ඩයන් ද මොවු හු අමතක නො කරති. එද පුරාණ සිරිතට අනුව නම් මෙසේ නැමූ මුට්ටි ඒ ළඟ කන්නයේ අස්වැන්න නෙළා අවසන් වන තුරු ආපසු හැරවීම තහනම් වූවත් පුල්එළිය කපුරාළ පැවසූ ආකාරයට එම මුට්ටි නැමීමෙන් අනතුරුව ඒ පිළිබඳව නැවත සොයා බැලීමක් සිදු නොවේ. එනම්, වර්තමානය වන විට මුට්ටි නැමීමේ මංගල්‍යය චාරිත්‍රයකට පමණක් ලඝු වෙමින් පවතිනවා ද, යන්න මෙහි දී මතු වූ ගැටළුවකි.

ඉතාමත් සුන්දර මෙම මුට්ටි නැමීමේ මංගල්‍යය පිළිබඳ කිසිදු විස්තරයක් ඊ.ආර්. ලිච් මහතාගේ පොතට ඇතුළත් වී නොමැත. ඇතැම් විට එතුමා මෙහි රැඳී සිටි කෙටි කාලය තුළ එවැන්නක් සිදු නොවීම ඊට හේතු වන්නට ඇත.

එද ගැමි සමාජය අදට වඩා බොහෝ දියුණු යැයි විටෙක සිතේ. ඔවුන්ගේ එකමුතුභාවය මෙන්ම කළගුණ සැලකීමේ මහඟු ගුණාංගය දැනටත් ඉහළින්ම දක ගත හැකි ය.

## සමාජ විද්‍යාත්මක විග්‍රහය

සමාජ විද්‍යාත්මකව මෙම අවස්ථා විග්‍රහ කළහොත් මෙම මානව සබඳතා හුදෙක් වර්ධනය වීමට මෙවැනි උත්සව, පුදපූජා විධි ඉවහල් වන බව පැහැදිලි ය. එපමණක් නොව, මෙම ගම්වාසීන් අධ්‍යාපනය අතින් ඉදිරියට නො ගිය ද ඔවුන් තුළ පවතින සාමූහික හැඟීම් අමතක කළ නොහැකිම තත්ත්වයකි. ඔවුන් ස්වභාව ධර්මයා සමඟ කොතරම් සමීප ද යත් නූතන විද්‍යාඥයකු පරයා යන තරමේ දැනුමක් ඔවුන් සතු බව ඔවුන් හා අදහස් හුවමාරු කර ගැනීමේ දී පැහැදිලි වේ. ඔවුන්ගේ ජීවිත ඒ තරමටම ස්වභාව ධර්මයා හා බැඳී පවතී.

ගමේ සාමකාමී පැවැත්ම තහවුරු කිරීමටත්, එකිනෙකාගේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය වීමත්, මෙහි දී සිදුවන වැදගත් කාර්යයකි. සමාජ විද්‍යාඥයකු වන මැලිනොව්ස්කි කෘත්‍යවාදය (Functionalism) හරහා ඉදිරිපත් කරනු ලැබුවේ ද මේ තත්ත්වයයි. එනම්, සමාජ සංසිද්ධිවල පවතින අන්තර් සම්බන්ධතාවයන් හා ඒවායේ සමාජමය කෘත්‍යයන් මොනවාද යන්න පිළිබඳවයි.

සමාජය තුළ පවතින මෙම අන්තර් සම්බන්ධතාවය එහි ක්‍රියාකාරීත්වයට දැඩි ලෙස බලපානු ලැබේ. සමාජය තුළ අපට විවිධාකාර වූ සමාජ සංස්ථාවන් හඳුනාගත හැකි වේ. නිදසුනක් ලෙස පවුල් සංස්ථාව, ආගමික සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව, ආර්ථික සංස්ථාව යනා දී වශයෙනි. ඒවා එකිනෙක හා බැඳී පවතී. එය සමාජයක සුමට ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපානු ලබයි. එහි දී, සෑම සමාජ සංස්ථාවකින්ම එම සමාජයට සැලකිය යුතු මට්ටමේ කෘත්‍යයක් ඉටු වේ. කෘත්‍යවාදයට අනුව ප්‍රකට සමාජ විද්‍යාඥයකු වන රොබට් කේ. මර්ටන් සමාජ කෘත්‍යයන් ප්‍රධාන කොටස් 2 කට බෙද දක්වා තිබේ. එනම්,

01. **ප්‍රකට කෘත්‍යයන්** (Manifest functions)

හා

02. **නිලීන කෘත්‍යයන්** (Latent functions) වශයෙනි.

ප්‍රකට කෘත්‍යයන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ යම් සමාජ පද්ධතියකින් අපේක්ෂා කරනු ලබන සහ එහි සහභාගිකයන් අතර පිළිගැනීමට ලක් වූ ඔවුන් එයට හොඳින් අනුවර්තනයවීම හෝ හැඩගැසීම මත, තම අරමුණු කරා ළඟාවීමේ දී ඇති වන්නා වූ ප්‍රතිඵලයයි. නිලීන කෘත්‍යය ප්‍රකට කෘත්‍යය හා සම්බන්ධ වන අතර ප්‍රකට කෘත්‍යයන් ඉටු වීම තුළ නිලීන කෘත්‍යයන් ක්‍රියාවට පරිවර්තනය වේ. එය, ප්‍රකට කෘත්‍යයක් ඉටුවීම තුළ අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵලයක් මෙන්ම එසේ නොවන්නා වූ ප්‍රතිඵලයක් විය හැකිය. (කරුණාතිලක කේ. 2005)

නිදසුනක් ලෙස පුල්එළිය ගමේ සිදු කෙරෙන මෙම මුට්ටි නැමීමේ මංගල්‍ය තුළ ඔවුන් බලාපොරොත්තු වන ප්‍රකට කෘත්‍යය වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ තම සමාජයේ පැවත එන සිරිතක් ඉටු කිරීම මගින් දෙවියන්ට පුද පූජා පවත්වා ආශිර්වාද ලබා ගැනීමයි. මේ කර්තව්‍යය මගින් එනම් මුට්ටි නැමීමේ මංගල්‍යය සිදු කිරීම දක්වා ගම්මුන් එකමුතු වී වැඩ කිරීම මගින් සමගිය සහයෝගය, අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනයවීම මෙන්ම දැනුම ඒ ළඟ පරම්පරාවට බෙදදීමත් මෙහි දී සිදුවන නිලීන කෘත්‍යයන් වේ. මෙම මංගල්‍යයේ කටයුතු සඳහා පරම්පරා තුනක සාමාජිකයින් සහභාගීවීම තුළින් තුන්වන පරම්පරාව මෙම චාරිත්‍රය ඉදිරියට ගෙන යා

යුතු ආකාරය පිළිබඳව අවිධිමත් දැනුමක් (Informal knowledge) ලබා ගනී. රොබට් කේ. මර්ටන් කෘත්‍යවාදය හරහා ඉදිරිපත් කළ එක් නිලීන කෘත්‍යයක් ලෙස මෙය විග්‍රහ කළ හැකිය.

**නිගමනය**

එක්දහස් නවසිය පණස් හතරේ (1954) ඊ.ආර්. ලීච් දුටු පුල්එළියට වඩා වර්තමාන පුල්එළිය බෙහෙවින් වෙනස් වී ඇති බව හැඟුණ ද, විශේෂත්වය වන්නේ මේ සියළු ගම්වැසියන් මේ වෙනස්වීම් ඉතා සුන්දර ලෙස භාර ගෙන තිබීමයි. මෙම ක්ෂේත්‍ර චාරිකාවේ දී මා ලද සුවිශේෂම වූ අත්දැකීම වන්නේ, මොවුන් කිසිවිටෙක, කිසිවකුට, කිසිවක් සඳහා ද්වේෂ රෝපණය නො කිරීමයි. මොවුන්ගේ ඇතැම් චාරිත්‍ර වාරිත්‍ර විධි නූතන විද්‍යාවට හසු නො වූවද, මොවුන් අතර පවතින සමගිය අන්‍යෝන්‍ය සුහදත්වය වර්තමානය දක්වා පැවතීමට මේවා බෙහෙවින්ම ඉවහල් වී ඇති බව නම් සටහන් කළ යුතුම ය. මේ සුන්දර ගම්වාසීන් ඊ.ආර්. ලීච් මහතාව අදටත් හඳුන්වනු ලබන්නේ සුදු මහත්තයා යන අන්වර්ත නාමයෙනි. එද සුදු මහත්තයා සමඟ ගණුදෙනු කළ අය මෙන්ම වර්තමාන පරම්පරාවේ දුරුවන් පවා සුදු මහත්තයාව මතකයට නඟන්නේ ඉතාමත් සුහද සිතිනි. ඒ ඔවුන් තුළ පවතින අව්‍යාජ ගැමිකම නිසාවෙනි.

එද ලීච් දුටු පුල්එළියට වඩා බෙහෙවින් වෙනස් වූ ගමක් වර්තමානයේ දැක ගත හැකි වූවත්, එද මෙන්ම අදටත් වෙනස් නොවූ දෙයක් හඳුනාගත හැකි ය. එනම්, එද පුල්එළිය ගම්වාසීන් සුදු මහත්තයාට දැක් වූ ළෙන්ගතු බව හා සහයෝගය අප කෙරෙහි ද ඔවුන් එලෙසින්ම දක්වීමයි. ඒ තුළින් පැහැදිලි වන්නේ සමාජ ඒකාබද්ධතාවයයි.

සමාජ විද්‍යාත්මකව විග්‍රහ කිරීමේ දී, මෙම උත්සවය හා බැඳි පවතින තවත් වැදගත් දෙයක් නම් කාර්යයන් පැවරීම දක්විය හැකිය. එනම්, මෙහි දී ගම්වාසී සියළු දෙනාටම යම් කාර්යභාරයක් පැවරී තිබේ. පුරුෂ පාර්ශවය දෙවියන් වෙනුවෙන් පැවැත්වෙන පූද පූජා වෙනුවෙන් කළමනා සූදානම් කිරීමේ සිට දෙවියන්ට ඒවා පූජා කිරීම දක්වා වූ කාර්යයන්වල නිරත වේ. එමෙන්ම, මංගල්‍යය සඳහා කැවුම් පිසීම මෙන්ම ගම්වාසීන්ට දිවා ආහාරය පිළියෙළ කිරීම යනා දී වගකීම පැවරෙන්නේ ස්ත්‍රී පාර්ශවයටයි. කුඩා දරුවන්ටත් යම් වැඩ කොටසක් මෙහි දී පැවරී තිබේ. ඒ වතුර ගෙන ඒම, සැරසිලි වැනි කාර්යයන් සඳහා උදව් කිරීමයි. මොවුන් සියළු දෙනාම බොහෝ උද්‍යෝගීමත් ලෙස මේ කාර්යයන් සඳහා තම දයකත්වය ලබා දේ. ඒ තුළ සියළුම දෙනාටම පිළිගැනීමක් මෙන්ම වගකීමක් හිමි වේ. එසේ ම සමාජ සබඳතා තව තවත් තහවුරු වන අතර එය යම් සමාජයකට සුමට ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන කාරණයකි.


**ඉන්දිකා පතිරණ**

පර්යේෂණ නිලධාරිනී

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



**ස්තූතිය**

"සංස්කෘතිය" නිරතුරුව වෙනස්කම්වලට බඳුන් වන්නකි. එකී වෙනස් වන සංස්කෘතිය තුළ විද්‍යමාන වන ලක්ෂණ බොහොමයකි. ඇඳුම-පැළඳුම, කතා-බහ, කත-බොන ආකාරය ඉන් සමහරකි. සම්ප්‍රදායික වෘත්තීන් හි තියැලෙන සමාජයේ ඇතැම් සංස්කෘතික ලක්ෂණයන් වෙස්කම්වලට බඳුන් වෙමින් තිබේ. එවන් අවස්ථාවක් මෙවර කවරයේ ජායාරූපයෙන් දැක් වේ. මෙම ජායාරූපය සපයා ගැනීමේ දී සහය දැක් වූ සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පුස්තකාල කාර්ය මණ්ඩලයට "ගොවි ජනතා" විශේෂ ස්තූතිය පිරිනැමේ.

- සංස්කාරක -